# ජාතික ශිල්ප සභාව

## ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය

## "කළමනාකාර සේවා ගණයේ II ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)" තනතුර

ජාතික ශිල්ප සභාවේ පුරප්පාඩුව ඇති කළමනාකාර සේවා ගණයේ II ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු 02 ක් සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** : ව්‍යාපෘති කළමනාකරණය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, සමාජ විද්‍යාව, ප්‍රජා විද්‍යාව, පුරා විද්‍යාව, වාණිජ්‍යය හෝ සෞන්දර්යය විෂයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක සංවර්ධන හා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද

**සටහන** : හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල සංවර්ධන කාර්යයන් පිළිබඳ පළපුරුද්ද සහ ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව අමතර සුදුසුමක් වේ.

**වයස් සීමාව** : අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බලනොපානු ඇත.)

**වැටුප් පරිමාණය :**

තනතුරට අයත් වැටුප් පරිමාණය (මාසික) :

MM 1-1 - 2006 රු. 25,640 - 3x665-7x735-15x925-46,655/-

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයින්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ ඔබ විසින් සභාව යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔබගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 8% කට නොඅඩු මුදලක් ප්‍රදානය කළ යුතු අතර, ජාතික ශිල්ප සභාව 12% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් සඳහා 3% ක් ජාතික ශිල්ප සභාව ගෙවනු ලැබේ.

අයදුම්කරුවන් සියලුම විස්තර සහිතව තම අයදුම්පත් උප්පැන්න සහතිකය අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික සහ පළපුරුද්ද දැක්වෙන සහතික වල පිටපත් සමඟ බත්තරමුල්ල, රෝහිනා මාවතේ පිහිටි ජාතික ශිල්ප සභාවේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් 2015-06-22 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"II ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු සඳහා අයදුම්පත්‍රය"** යන්න සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශය සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**ජනකලා කේන්ද්‍ර පරිශ්‍රය,**
**රෝහිනා මාවත,**
**බත්තරමුල්ල.**

**සභාපති,**
**ජාතික ශිල්ප සභාව,**

**දිනය : 2015-05-27**